# බළන්ගොඩ නගර සභාව

## 2025-07-23 වන දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2025.07.23**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති කේ. ජී පේමදාස මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | කේ. ජී පේමදාස මැතිතුමා |
| 2. ගරු උප සභාපති | පේසල ටී. ජයසේන මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම් රූමි මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්.නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රිනී | පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රී | එන්.ඒ සී. චන්දන මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රී | ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එස්.යූ.සී. ජයනක මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා |
| 14. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්. එච්. ඒ. කරුණාරත්න මිය

ගරු සභාපතිතුමන් විසින් මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු සියළුම දෙනා පිළිගනිමින් ආගම සිහි කිරීමෙන් අනතුරුව ගරු සභාවේ වැඩකටයුතු ආරම්භ කළ අතර, බළන්ගොඩ නගර සභාව වෙත තාවකාලික/අනියම් කම්කරුවන් 10 දෙනෙකු තත්කාර්ය පදනම මත සේවයේ යෙදෙවා ගැනීමට අනුමැතිය ලබා ගැනීම සහ බළන්ගොඩ නගරයේ 2025-07-01 දින සිට 2025-07-15 දින දක්වා කසළ ඉවත් කිරීම වෙනුවෙන් කසළ ටෙන්ඩර්කරු වෙත රු.525,000 ක මුදලක් ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීම වෙනුවෙන් මෙදින විශේෂ මහ සභාව පවත්වන බව ද පවසන ලදී.

මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වීමට නොහැකි බව දන්වමින් ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සහ ගරු නාගරික මන්තත්‍රී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ලිපි යොමු කර ඇති බව ගරු සභාපතිතුමන් පවසන ලදුව ඒ සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

**01. බළන්ගොඩ නගර සභාව වෙත තාවකාලික/අනියම් කම්කරුවන් 10 දෙනෙකු තත්කාර්ය පදනම මත සේවයේ යොදවා ගැනීමට අනුමැතිය ලබා ගැනීම.**

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් සභාවේ වැඩ කටයුතු පවත්වා ගෙන යාමේදී විශාල අඩුවක්ව කම්කරු ගැටළුව පවතින බවත්,වේගයෙන් වැඩ කටයුතු සිදු කර ගෙන යාම අත්‍යවශ්‍ය බවත් ඒ සඳහා සෞඛ්‍ය කම්කරුවන් දැනට සිටින ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බවත්, නඩත්තු කටයුතු පිළිබඳව විශාල මහජන ඉල්ලීම් ප්‍රමාණයක් ලැබී ඇති බවත් එම ඉල්ලීම් ප්‍රමාණය ඉටු කිරීමේ ප්‍රමාදයක් සිදු වන්නේ කම්කරු ගැටළුව හේතුවෙන් බවත්, ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමිය මේ පිළිබඳව දැනුවත් කළ බවත් එතුමියගෙන් කම්කරුවන් සේවයේ යොදවා ගැනීම පිළිබඳව අවසරය ඉල්ලා සිටි බවත්,දැනට කම්කරුවන් ලෙස සේවයේ යෙදී සිටින ලයිස්තුවක් ඉදිරිපත් කළ බවත්, ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමිය කම්කරුවන් සේවයේ යොදවා ගන්නේ නම් තනතුරේ සේවය කළ හැකි අයවලුන් පමණක් සේවය සඳහා යොදවා ගන්නා ලෙස දැනුම් දුන් බවත් පවසන ලදී.

ඒ අනුව සභාවේ දැනට සෞඛ්‍ය කම්කරුවන් ලෙස ස්ථිරව ඇති පිරිසගෙන් ඇතැම් පිරිසක් තනතුරේ රාජකාරී නොව වෙනත් රාජකාරීවල යොදවා ඇති බැවින්, සෞඛ්‍ය කම්කරුවන් ලෙස තනතුරේ රාජකාරී ඉටුකළ හැකි තාවකාලික/අනියම් කම්කරුවන් 10 දෙනෙකු තත්කාර්ය පදනම මත සේවයේ යොදවා ගැනීමට සභා අනුමැතිය ලබා ගෙන ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය වෙත ඉදිරිපත් කිරීම කළ යුතු බැවින් ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් දන්වන ලදී.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුම් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් මේ පිළිබඳව තමන් කරුණු ඉදිරිපත් කරන්නේ මෙම යෝජනාව පිළිබඳව කිසිදු කඩාකප්පල් කිරීමේ පරමාර්ථයකින් නොවන බවත් හුදෙක් අදහස් දැක්වීමක් පමණක් බවත්, මෙම ගැටළුව පිළබඳව දන්නා බවත්,ආණ්ඩුකාරතුමිය ඉහත කාරණාවට අනුමැතිය ලබා දී ඇතිනම් ඒ පිළිබඳ ගැටළුවක් නොමැති බවත් නමුත් එය ලිඛිතවද වාචිකවද යන්න පිළිබඳව තමන් නොදන්නා බවත්, ඕනෑම රාජ්‍ය ආයතනයකට අවශ්‍ය කාර්යය මණ්ඩලය කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් නම් කර එවනු ලබන බවත් පළාත් සභාවටද එසේ විය යුතුය යන්න අදහස් කරන බවත්,ඒ අනුව මෙම සභාවේ අනුමත කාර්යය මණ්ඩලය තුළ වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් 18 දෙනෙකු සිටින බවත් 15 දෙනෙකු සේවයේ යෙදෙන බවත්, 03 දෙනෙකුගේ පුරප්පාඩුවක් පවතින බවත්, ඒ අනුව මෙම සේවකයන් දැනට මහා භාණ්ඩාගාරය මගින් වැටුප් ලබන බවත්, තවත් සේවකයන් 10 දෙනෙකු බඳවාගෙන සභාවේ අරමුදල් යොදවා වැටුප් ගෙවීම තුළින් එය තනිකරම මූල්‍ය නීතී වලට පටහැනි බවත්,

එසේම සේවකයන් 15දෙනෙක් සිටියදී එම සේවකයන්ගෙන් වැඩ කළමණාකරණය කිරීම සිදු කර නොගෙන ඇති බවත්, මෙම සේවකයන් 15 දෙනාද සභාවේ නොසිටියේ නම් පමණක් සභාවේ අනුමැතිය ලබා ගෙන මෙලෙස කම්කරුවන් බඳවා ගැනීම සිදු කිරීමට හැකියාව ඇති බවත්, සභාවේ මාණ්ඩලික නිලධාරීන්ගේ වගකීම ලබා දී ඇති මානව සම්පතින් ප්‍රයෝජන ගැනීම බවත්, එසේ නොකර මෙලෙස සභාව යෝජනා සම්මත කර කම්කරුවන් බඳවා ගැනීම තුළින් සභාව එම වගකීමට බැඳෙන බවත්, ගරු ආණ්ඩුකාරතුමිය අනුමැතිය ලබා දෙනු ලබන්නේද සභාවේ අනුමැතියට යටත්ව විය යුතු බවට අදහස් කරන බවත්, සභාවේ මේ වන විට වසර ගණනාවක් තිස්සේ EPF/ETF කපන සේවකයන් 08 දෙනෙකු පමණ සිටින බවත් ඔවුන්ටත් අමතරව මෙසේ බඳවාගනු ලබන්නේද යන්නත්, මෙය අනිවාර්යෙන්ම විගණනයට හේතු වන කරුණක් විය හැකි බවත් එවිට සභාවේ සභිකයන් එයට අනුමැතිය ලබා දුන්නා සේ පවසන බවත් ,ඒ අනුව තමන් මෙම යෝජනාවට සම්පූර්ණ විරෝධතාවය ප්‍රකාශකරන බවත්, වංචාවට දූෂණයට තිත තබනවායැයි පත් වූ ආණ්ඩු මගින් කලින් පාලනය මෙන් මෙවැනි දේ සිදු කිරීම මගින් සමාජය බලාපොරොත්තුවන දේ ඉෂ්ට නොවන බවත් පවසමින් තමන්ගේ දීර්ඝ අදහස් දැක්වීම සිදු කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා පෙ.ව 10.07 ට පමණ සභාවට පැමිණෙන ලදී.**

ගරු සභාපතිතුමා, ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා පවසන දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ආදියෙහි සේවකයන් බඳවාගැනීමට වඩා පළාත් පාලන ආයතනවල විෂය පථය වෙනස් බවත්, එහිදී සභා සම්මුතියෙන් ලබා ගන්නා ඕනෑම තීරණයක් වලංගු බවත්, දැනට ආණ්ඩුකාරතුමිගේ අවසරය මේ වෙනුවෙන් ඉල්ලා ඇති බවත්, ඊට අමතරව මෙහි සිටින කම්කරුවන් යොදවා ඇති ක්ෂේත්‍ර පිළිබඳව වාර්තාවක් ලබා දී ඇති බවත්, සභාවේ රියදුරු සේවය ,මුර සේවය ඇතුළු ක්ෂේත්‍ර කිහිපයක පුරප්පාඩු පවතින බවත්, සෞඛ්‍ය කම්කරුවන් ලෙස සිටින අය කිහිපදෙනෙකු රියදුරු සේවාවේ යෙදෙන බවත්, රියදුරු බලපත්‍රයක් සහිත ඕනෑම අයෙකුට වාහනයක් පැදවිය හැකි බවත්, ඒ අනුව අනුමැතිය ලබා දීම මගින් මෙලෙස සේවයේ යොදවා ඇති බවත්, මෙම යෝජනාවට පක්ෂ හෝ විපක්ෂ වීම ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමාගේ අයිතිය බවත්, මීන් පෙර පැවැති පාලනයන් මගින් අදාළ

තනතුරේ රාජකාරී වලට නොමැතිව බඳවාගැනීම තුළින් මෙලෙස ගැටළුවකට මුහුණපෑමට සිදුව ඇති බවත් විරුද්ධ වීම හෝ පක්ෂ වීම සභිකයන්ගේ අයිතිය බවත් ඒ අනුව අදහස් දැක්වීම සිදු කරන ලෙසත් දැනුම් දෙන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් මෙම කාරණාව පිළිබඳව ප්‍රායෝගිකව සලකා බැලිය යුතු බවද ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමාගේ අදහස් දැක්වීමට එකඟ බවද , එලෙස බඳවා ගෙන ඇති පිරිස කුමක් හෝ රාජකාරියක් ආවරණය කරන බවද, ඒ අනුව එම පිරිස ක්ෂේත්‍රයට දැමීම තුළින් ඔවුන් සේවය කළ රාජකාරියට අදාළ තනතුර නැවත එම තනතුරු පුරප්පාඩු වන බවද, ලංකාවේ සෑම පළාත් පාලන ආයතනයකම මෙම ගැටළුව පවතින බවද , මෙය විගණනයකට කිසිසේත්ම ලක්වන කරුණක් නොවන බවද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමාගේ අදහස් දැක්වීමට අනුව එහි යම් සාධාරණ බවක් පවත්නා බවත්,නමුත් පසුගිය කාලයේ පළාත් පාලන ආයතනවල ක්‍රීඩා තරඟ වෙනුවෙන් මෙලෙස දක්ෂතා ඇති පිරිසක් බඳවා ගනු ලැබූ බවත් එම පිරිස ස්ථිර වූ තනතුරට වඩා විවිධ දක්ෂතා සහිත බැවින් සභාවේ වෙනත් රාජකාරී වෙත යොදවා ඇති බවත්, සභාවේ කාර්යයන් සිදු කිරීමට කම්කරුවන් අත්‍යවශ්‍ය බැවින් බඳවාගැනීම සාධාරණ බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නගර සභාවේ හිටපු සභාපති ගරු නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමාගේ පාලන සමයේ රාජ්‍ය සේවා ක්‍රීඩා තරඟ වෙනුවෙන් ක්‍රීඩා දක්ෂතා ඇති පිරිසක් විවිධ තනතුරු සඳහා බඳවාගත් බවත්, එම කාලයේදී එහි වැරැද්දක් පෙනී ගියේ නැති බවත්, නමුත් පසු කාලීනව එම බඳවාගැනීමේ ක්‍රමවේදය නිවරදි නොවන බවට පිළිගන්නා බවත්, තමන්ගේ පාලන වකවානුව තුළ සභාවට ආදායම් ලබා දීම වෙනුවෙන් ක්‍රියා කිරීම් සිදු කළද දැන් පාර්ලිමේන්තු විගණනයට පවා ලක්වී ඇති බවත්, ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමාගේ අදහස් දැක්වීම 100% සත්‍ය බවත්, මෙම කාරණාවේ ප්‍රායෝගික තත්වයද පැහැදිලි බවත්, සභිකයන් අනුමැතිය දුන්නා සේ නොසලකා ගරු ආණ්ඩුකාරතුමිය අනුමැතිය දුන් සේ සලකා බඳවාගැනීම් සිදු කරන ලෙසත්, පරිස්සමින් අදාළ බඳවාගැනීම් සිදු කර ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබා ගන්නා ලෙසත්, තමන් මෙම බැඳීයාවන්ගෙන් නිදහස් කරන ලෙසත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමාගේ අදහස් දැක්වීමට එකඟ බවත්, නමුත් විශාල මහජන ඉල්ලීම් ප්‍රමාණයක් පවතින බැවින් අමතර සේවකයන් බඳවාගෙන හෝ එම සේවාවන් සිදු කළ යුතුව පවතින බැවින් එලෙස බඳවාගෙන හෝ එම වැඩ ප්‍රමාණය අවසන් කරන ලෙසත් , ඒ අනුව මෙම බඳවාගැනීමට තමන් එකඟ බවත් පවසන ලදී.

ගරු සභාපතිතිතුමා පැවසුයේ ජනාධිපතිතුමාද සත්භාවයෙන් අවංකව කරන ඕනෑම ක්‍රියාවක් වෙනුවෙන් එතුමාගේ සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කර ඇති බවත්, මෙම කම්කරුවන් සේවයේ

යොදවා ගැනීම තුළින් කිසිම වංචාවක් දූෂණයක් අතයට ගනුදෙනුවක් සිදු නොවන බවත් එලෙස සිදු වූ අතීතයක් පැවති බවත්, විශාල මහජන ඉල්ලීම් ප්‍රමාණයක් ලැබෙන බැවින් ඒවා ඉටු කිරීම සඳහා අනිවාර්යෙන් කම්කරුවන් සේවයේ යොදවා ගැනීම සිදු කළ යුතු බවත්, ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමාට විරුද්ධව අදහස් දැක්වීමට හැකි බවත්, එතුමාගේ විරුද්ධත්වය පිළිගන්නා බවත් ,එසේ වුවද එතුමාගේ නඩත්තු ඉල්ලීම් වලටද අවස්ථාව ලබා දෙන බවත්ය.

ඒ අනුව නැවතත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූයේ සභාවට කාර්යසාධන තරඟ හෝ කුමකට හෝ බඳවාගෙන ඇත්නම් තනතුර සෞඛ්‍ය කම්කරුවන් නම් අදාළ තනතුරේ රාජකාරී සිදු කළ යුතු බවත්, ඕනෑම අයෙකු පත්වීම් බලධාරියෙක් මඟින් ලද පත්වීමකට අදාළ රාජකාරිය අනිවාර්යෙන්ම ඉටුකළ යුතු බවත්, ඒ අනුව ප්‍රමාණවත් සේවක මණ්ඩලයක් සිටියදී අමතර සේවකයන් බඳවාගැනීමකට කිසිසේත් එකඟ විය නොහැකි බවත්ය.

ඉහත යෝජනාවට සභාවේ විරුද්ධව අදහස් ප්‍රකාශ වී ඇති බැවින් එම යෝජනාව වන බළන්ගොඩ නගර සභාව වෙත තාවකාලික/අනියම් කම්කරුවන් 10 දෙනෙකු තත්කාර්ය පදනම මත සේවයේ යොදවා ගැනීමට අනුමැතිය ලබා ගැනීම සඳහා පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන් බෙදීමකට යා යුතු බව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම්තුමිය වෙත දැනුම් දෙන ලදී.

ඒ අනුව බළන්ගොඩ නගර සභාව වෙත තාවකාලික/අනියම් කම්කරුවන් 10 දෙනෙකු තත්කාර්ය පදනම මත සේවයේ යොදවා ගැනීමට අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජනාවට පක්ෂව ගරු සභිකවරුන් 11 දෙනෙකු ද, එනම්,

01. ගරු සභාපති කේ. ජී පේමදාස මැතිතුමා
02. ගරු උප සභාපති පේසල ටී. ජයසේන මැතිතුමා
03. ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා
04. ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා
05. ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා
06. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
07. ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ සී. චන්දන මැතිතුමා
08. ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා
09. ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා
10. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා

11. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා

ඒ සඳහා විපක්ෂව ගරු සභිකවරුන් 02 දෙනෙකුද, එනම්,

01. ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය

02. ගරු නාගරික මන්ත්‍රි එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා

ඒ සඳහා ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි සභිකවරයා ලෙස ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමාද යනාදී ලෙස සභිකවරුන් ඡන්දය ප්‍රකාශ කළ අතර, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය සභාවට නොපැමිණි සභිකයන් වේ.

ඒ අනුව බළන්ගොඩ නගර සභාව වෙත තාවකාලික/අනියම් කම්කරුවන් 10 දෙනෙකු තත්කාර්ය පදනම මත සේවයේ යොදවා ගැනීමට අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජනාවට පක්ෂව ඡන්ද 11 ක් ද විපක්ෂව ඡන්ද 02 ක් ද ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි 01 ක්ද වශයෙන් වැඩි ඡන්ද 09 කින් සභා සම්මත විය.

**ඒ අනුව ඉහත යෝජනාව ගරු සභාවේ වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**02.බළන්ගොඩ නගරයේ 2025-07-01 දින සිට 2025-07-15 දින දක්වා කසළ ඉවත් කිරීම වෙනුවෙන් ටෙන්ඩර්කරු වෙත රු.525,000 ක මුදලක් ගෙවීම වෙනුවෙන් අනුමැතිය ලබා ගැනීම.**

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

අනතුරුව ගරු සභාපතිතුමා අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සඳහා ස්තුතිය පුදකරමින් පෙ.ව 10.35 ට පමණ මෙදින විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

කේ. පී.පේමදාස,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.